කුලියාපිටිය ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 18 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.16,201,208 ක් වූ විවිධ ණය හිමියන් එක් ලෙජර් ගිණුමක් ලෙස පවත්වාගෙන යාම හේතුවෙන් කේවල ගිණුම් ශේෂ හඳුනාගත නොහැකිවුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව නඩු කටයුතු 10 කට බැඳී තිබුණද, එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණු අතර ඒවා හෙළිදරව් කිරීම සලකා බැලීම සඳහා ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක්ද සකස් කර නොතිබුණි.

#### 1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාව මඟින් පෙන්වා දෙනු ලැබූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ආ) පුර නැගුම ව්‍යාපෘතිය මඟින් ඉදි කරනු ලැබූ ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු.40,287,354 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂය අවසානය වන විට සභාබල ප්‍රදේශයේ කිතලව හා හොරොම්බාව යන ස්ථානවල ඉදි කරනු ලැබූ සතිපොල ඉදි කිරීම් පිරිවැය ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දේපල වෙන්දේසි කිරීමේදී සභාවේ පොදු පහසුකම් සඳහා "මුරුතැන්නේ ඉන්නාවත්ත" ඉඩමින් වෙන්කළ රූඩ් 02 පර්චස් 01.06 කොටස සහ "ඉඟුරු වත්ත නිල්දිය පොකුණ" ඉඩමේ රූඩ් 02 පර්චස් 30 ක කොටසට අදාල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව පලාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු මාසික වාරික 05 ක අගය වූ රු.77,372 ක් ගිණුම්ගත කර නොතිබුණි. එම වටිනාකමින් වියදම් හා වියදම් ණයහිමි ශේෂය අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර තිබූ මුද්දර ගාස්තු ආදායම වූ රු.72,842,400 ක ප්‍රමාණය සභාවේ උත්පාදිත නොවන වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවද, උත්පාදිත ආදායම් වූ සේවා සඳහා ගාස්තු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට 2014 හා 2015 වර්ෂ සඳහා මුද්දර ගාස්තු ලෙස රු.69,268,484 ක් පමණ ලැබිය යුතුව තිබුණද, ගිණුම්ගත කර තිබුණේ රු.42,500,000 ක් පමණි.

(ඌ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.16,881,501 ක උසාවි දඩ වෙනුවෙන් රු.8,070,759 ක් දක්වා තිබීම හේතුවෙන් උසාවි දඩ ආදායම් හා ලැබිය යුතු ආදායම් රු.8,810,742 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

## 1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 05 කට අදාල ලෙජර් ගිණුම් අනුව ශේෂයන් හා ඊට අනුරූපී, උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.21,684,231 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 58,283,758 ක් වූ අතර ඉන් රු.633,448 ක් වටිනා ශේෂ සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රු.170,230 ක් වූ ශේෂයන් වසර 03 කට වැඩි කාලයක සිට අය නොවන ශේෂයන් විය.

### 1.3.5 ගෙවිය යුතු ගිණුම්

(i) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 28,082,384 ක් වූ අතර ඉන් රු.19,795,935 ක් වටිනා ශේෂ සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගෙවිය යුතු ගිණුම් තුළ දීර්ඝ කාලයක සිට පවතින තොරතුරු ඉදිරිපත් නොවූ රු.254,516 ක ගිණුම් ශේෂ 03 ක් පැවතුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඉකුත් වර්ෂවල සිට පැවත එන රු.19,795,935 ක ගෙවිය යුතු ණයහිමි ශේෂ සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛනයක් ඉදිරිපත් නොවීම මත නියැදි පදනම මත සතුටුදායක පරීක්ෂාවක් කළ නොහැකි විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,942,450 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,115,357 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.65,827,093 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.22,021,196 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.88,919,364 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.7,044,282 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | ආදායම 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | වියදම 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 96,223 | 31,568 | 64,655 | පෞද්ගලික පඩිනඩි | 62,359 | 44,646 | 17,713 |
| (ii) | වෙනත් | 65,340 | 48,240 | 17,100 | අනෙකුත් | 25,261 | 27,047 | (1,786) |
| | උප එකතුව | 161,563 | 79,808 | 81,755 | උප එකතුව | 87,620 | 71,693 | 15,927 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 22,021 | 106,743 | (84,722) | ප්‍රාග්ධන වියදම | 88,919 | 99,198 | (10,279) |
| | මුළු එකතුව | 183,584 | 186,551 | 2,967 | මුළු එකතුව | 176,539 | 170,891 | 5,648 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 73,943 | 8,115 | 65,828 | අතිරික්තය | 7,045 | 15,660 | (8,615) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.161,563,033 න් සියයට 85 ක් හෙවත් රු.138,182,338 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.22,021,196 ක මුළු ප්‍රමාණයම පළාත් නිශ්චිත හා ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.87,620,584 න් සියයට 71 ක් හෙවත් රු.62,359,321 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 86 ක් හෙවත් රු.53,645,665 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.88,919,364 න් සියයට 10 ක් හෙවත් රු.9,514,826 ක් ස්ථාවර

වත්කම් අත්පත් කර ගැනීම සඳහාද, ඉතිරි සියයට 90 ක් වූ රු.79,404,538 ක් භෞතික සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂ හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 720 | 644 | 633 | 920 | 927 | 702 |
| (ii) බදුකුලී | 6,785 | 6,751 | 27 | 5,608 | 5,608 | 646 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,082 | 1,142 | - | 910 | 915 | 58 |
| (iv) වෙනත් ආදායම් | 81,988 | 153,025 | 50,851 | 179,057 | 72,357 | 72,144 |
| එකතුව | 90,575 | 161,562 | 51,511 | 186,495 | 79,807 | 73,550 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | හිඟහිටි ශේෂය 2015/12/31 දිනට ගණනය කිරීම් අනුව ශේෂය | 2015/12/31 දිනට මුළු හිඟය (මූල්‍ය ප්‍රකාශන අනුව) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 | රු. 000 |
| වරිපනම් හා බදු | 639 | 706 | 1,345 | 307 | 632 | 939 | 332 | 74 | 406 | 633 |
| බදු කුලී | 126 | 4,217 | 4,343 | 105 | 4,226 | 4,331 | 21 | (9) | 12 | 27 |
| බලපත්‍ර ගාස්තු | 72 | 1,080 | 1,152 | 72 | 1,080 | 1,152 | - | - | - | - |
| වෙනත් ආදායම් | 22,438 | 153,026 | 175,464 | - | - | 123,336 | - | - | 52,128 | 50,851 |
| එකතුව | 23,275 | 159,029 | 182,304 | 484 | 5,938 | 129,758 | 353 | 65 | 52,546 | 51,511 |

(අ) සභාවේ ආදායම් ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු හේතුවෙන් ලේඛන මත ගණනය කිරීම අනුව 2015 ජනවාරි 01 දිනට සහ 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂයන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයන් එකිනෙකට පරස්පර වූ අතර වෙනත් ආදායම් රැස් කිරීම බිල්කළ හා හිඟයෙන් ලැබීම් ලෙස පිළියෙල කර නොතිබුණි.

(ආ) වරිපනම් හා බදු යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව රු.705,650 ක් බිල්කර පැවතියද එයින් අයකර පැවතියේ රු.632,390 ක් හෙවත් සියයට 90 ක් පමණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට මූල්‍ය ප්‍රකාශන අනුව රු.633,446 ක හිඟයක්වූ අතර එය වාර්ෂික බිල් කිරීම්වලින් සියයට 90 ක් විය. 2016 ජූලි මාසය වන විට මෙම හිඟ මුදලින් රු.136,941 ක් අයකර තිබුණි.

**2.3.3** <u>වරිපනම් බදු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී වරිපනම් දේපල වාර්ෂික වටිනාකම් නව තක්සේරුවක් සිදුකර ඇති අතර ඉන් පසු සිදු කරන ලද නව ඉදි කිරීම් සඳහා අනුමත කරනු ලබන ඉදි කිරීම් සැලසුම් පිළිබඳ පසු විපරම් කර අනුකූලතා සහතික නිකුත් කර වරිපනම් බදු සංශෝධනය කර අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වරිපනම් බදු ලේඛනය කාර්තුව අවසානයේ තුලනය කිරීමෙන් පසු කාර්තුවට අදාළ හිඟය තීරණය කර හිඟ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. ඒ හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.348,718 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතියත් එම හිඟයන් අදාළ කාලය හඳුනා ගැනීමේ හැකියාව නොතිබුණි.

**2.3.4** <u>අක්කර බදු</u>

2015 දෙසැම්බර් 31 දිනට අක්කර බදු හිඟ ශේෂය රු.284,728 ක් වූ අතර හිඟ ලේඛන පිළියෙල කර නොතිබීම හේතුවෙන් එම හිඟයන්ට අදාළ කාලය හඳුනා ගැනීමේ හැකියාව නොතිබුණි.

**2.3.5** <u>බදු කුලී</u>

(අ) කටුපොත අංක 03 සිට 12 දක්වා කඩ කාමර 10 ක් 2014 ජූනි 26 දින සභාවට පවරාගෙන තිබුණි. මෙම කඩ කාමර 2015 වර්ෂය සඳහා වත්කම් බදු දීමේදී ටෙන්ඩර් දැන්වීමට ඇතුළත් කර බදු දීමට ක්‍රියාකර නොතිබුණු අතර ඒ හේතුවෙන් 2015 වර්ෂය තුළ මෙම කඩ කාමර 10 න් ලබාගත හැකිව තිබු බදු කුලී සභාවට අහිමිවී තිබුණි.

(ආ) අවම ලංසු එකතුව රු.1,199,383 ක් වූ වත්කම් 34 ක් 2015 වර්ෂය සඳහා ටෙන්ඩර් මඟින් බදු දීමට තෙවරක් මිල ගණන් කැඳවීම් කළද, ලංසු ඉදිරිපත් වී නොතිබුණි.

## 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.3,810,742 ක්ද, මුද්දර ගාස්තු රු.42,504,730 ක්ද විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල මඟින් මුද්දර ගාස්තු උපලේඛන සකසා පළාත් ආදායම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණද, 2010 වර්ෂය සඳහා රු.1,545,000 ක් 2011 වර්ෂය සඳහා රු.625,300 ක් සහ 2013 වර්ෂය සඳහා රු.714,500 ක් ලෙස එකතුව රු.2,884,800 ක මුද්දර ගාස්තු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට බැරකර නොමැති බැවින් එම මුදල් නිදහස් කළ නොහැකි බව සඳහන් කර පළාත් ආදායම් කොමසාරිස් විසින් ප්‍රධාන ලේකම් වෙත දැනුම් දී තිබුණි. එම තත්ත්වය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නිෂ්පාදනය කරනු ලබන කුට්ටිගල් එකක් රු.24 බැගින් සභාව මිලදී ගැනීමේ කොන්දේසිය යටතේ රු.130,862 ක් වටිනා, කොන්ක්‍රීට් කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය, කුට්ටිගල් පදම් කරන ටැංකි 05 ක් හා ගල් වියලන දැව අච්චු කොන්ත්‍රාත් පදනම යටතේ ලබා ගැනීමේ ගිවිසුමකට එළඹ 2013 මැයි 02 දින කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණද, 2013 නොවැම්බර් 21 දින සිට කුට්ටිගල් නිෂ්පාදනය නතර කර තිබුණි.

(ඇ) මැටි වැව ගම්මානයේ මැටි වලං කර්මාන්තය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන මඟින් රු.400,000 ක ප්‍රතිපාදන ලබාගත හැකිව තිබුණද රු.350,532 ක් පමණක් වියදම් කර ක්‍රියාත්මක කර තිබුණි. විධිමත් අධීක්ෂණයක් හෝ පසු විපරම් නොමැති වීම මත ක්‍රියාකාරීත්වය මඟ නතර කර තිබූ අතර නැවත පසු විපරම් කර ක්‍රියාත්මක මට්ටමකට ගෙන ඒමට වැඩ සටහනක් ක්‍රියාත්මක කරන බව 2016 ජනවාරි 27 දින සභාවේ ලේකම්වරයා මා වෙත දන්වා තිබුණද, 2016 මැයි 30 දින වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) පල්ලේගෙදර කොලොන්ගොල්ල (අක්කර 05) හයියාල අගාර වත්ත ඉඩම (අක්කර 03 රූඩ් 03 පර්චස් 20) හා හොරොම්බාව කුරුගල්ගොඩ වත්ත ඉඩම (අක්කර 03 පර්චස් 25) වෙන්දේසි කිරීමේදී සභාවට පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස් ඔප්පු මඟින් සභාවට ලබාගෙන නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ වෙන්දේසි කරමින් පැවති ඉඩම් 03 ක පරීක්ෂාවේදී සියයට 1 ක බදු මුදල් ගෙවීමට ඇස්තමේන්තු වටිනාකම ලෙස ලබාගෙන තිබුණු මුදල හා විකුණුම්කරු දැන්වීම් මගින් ප්‍රචාරය කරන ලද ඉඩම් කොටසක අවම මිල සලකා බැලුවද, රු.157,273 ක මුදලක් තවදුරටත් ලබා ගැනීමට තිබූ බව නිරීක්ෂණය වූ අතර අතුරු ව්‍යවස්ථාවේ 14 (2) ප්‍රකාරව ත්‍රෛමාසික විකුණුම් පිළිබඳව වාර්තා ලබාගෙන විකුණුම් මිල මත බදු මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් 2011 වර්ෂයට පෙර සිට පැවත එන අයවිය යුතු රු.140,418 ක්, විශ්‍රාම ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.5,289ක් හා මියගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.4,150 ක් වශයෙන් රු. 149,857 ක හිඟ සේවක ණය ශේෂයන් පැවතුණි.

### 3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

ප්‍රධාන කාර්යාලය, උප කාර්යාල 03 ක් සහ සතිපොල 03 ක් ඇතුළු බල ප්‍රදේශය පුරා එකතුවන කසල දිරන සහ නොදිරන ලෙස වෙන්කර එකතු කිරීම සිදුකරනු ලැබුවද අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමක් සභාව මගින් ක්‍රියාත්මක නොවන අතර එකතු කරන ලද අපද්‍රව්‍ය තුල අඩංගු පොලිතින් අලෙවි කිරීම සඳහා වෙන් කර තබා ගැනීමට කටයුතු කර දිරන කසල අලහිටියාව පෞද්ගලික ඉඩමකට දැමීම පමණක් සිදුකර තිබුණි.

## 04 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

### 4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 වත්කම් කළමනාකරණය

#### 4.2.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2014 වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද ඩම්ප් ට්‍රක් රථය ලියාපදිංචි නොකිරීම හා ආදායම් බලපත්‍ර, රක්ෂණ සහතික ලබා නොගෙන 2015 වර්ෂයේ මාස 09 ක් නිෂ්කාර්යයව තිබුණි.

**05** **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පාලනය